6-04-2016

ද මැසිනොද් විදුහල, කඳාන

# පුරවැසි අධ්‍යාපනය

07 ශ්‍රේණිය

I කොටස

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

1. පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව පවුල් වර්ග
   1. 3
   2. 2
   3. 4
   4. 1

2. විවේකය ගතකළ හැකි ක්‍රමයක් වන්නේ
   1. ක්‍රීඩා
   2. විනෝදාංශ
   3. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්
   4. ඉහත සියල්ලම

3. විවේක කාලය ගත කළ යුත්තේ
   1. නිකරුණේ
   2. කේලම් කියමින්
   3. ඵලදායිව
   4. රණ්ඩු කරමින්

4. ඔබට සමාන ඇඟිලි සලකුණු ඇති පුද්ගලයා
   1. මවය
   2. පියාය
   3. නිවුන් සහෝදරයාය
   4. වෙන කිසිම පුද්ගලයෙකු නැත

5. අප පිවත් වන සමාජයේ අහිතකර බලවේග
   1. යුද්ධය
   2. සොරකම
   3. පාපමිතුරු ඇසුර
   4. ඉහත සියල්ලම

6. හැම පුද්ගලයෙකුම තම උපත සමග ප්‍රථමයෙන් සාමාජිකත්වය ලබන සමාජ ඒකකය
   1. පාසල
   2. නිවස
   3. පවුල
   4. සමාජය

7. පවුලෙන් අපට ලැබෙන දෙයක් නොවන්නේ
   1. ආදාරය
   2. වෛරය
   3. කරුණාව
   4. පිළිගැනීම

8. ඔබගේ පියාගේ මල්ලී ඔබට නෑදෑකමට
   1. බාප්පා
   2. මහප්පා
   3. සීයා
   4. මස්සිනා

9. පවුල නැමැති සමාජ ඒකකයේ දැක්නට ලැබෙන මූලික ලක්ෂණයකි
   1. අදහස් හුවමාරුව සංබාවකින් යුක්ත වීම
   2. දයාව ලැබීම
   3. පුද්ගලයන් විශාල සංබාවකින් යුක්ත වීම
   4. සාමාජිතයන් සියළු දෙනා එක් වාසස්ථානයක පිවත් වීම

10. සෑම යහපත් ක්‍රියාවක්ම ආරම්භ වන්නේ යහපත්
    1. පුද්ගලයෙන් නිසාය
    2. සිතුවිල්ලක් නිසාය
    3. ස්ථානයක් නිසාය
    4. අයෙක් නිසාය

- හරි වැරදි යොදන්න

1. ඔබ තුල ඇති සුවිශේෂී ගුණ නිසා ඇතිවන උසස් හැගීමකි ( )
2. පුද්ගලයන් මුහුණපාන විවිධ අවස්ථාවලදී සිත තුළ ජනිත වන සිතුවිලි චිත්තවේග වේ ( )
3. එදිනෙදා ජීවිතයේදී අප විසින් සිදු කරන් යහපත් දැ චිරිත් ලෙස හඳුන්වයි ( )
4. පුද්ගලයෙකුට සමාජයේ තනිව ජීවත් විය හැක ( )
5. බුද්ධිමත් පාරිභෝගිකයකු ලෙස අප වෙළඳපල තත්වය කෙරේ අවධානය යොමු කළ යුතුය ( )
6. ජීවත් වීම යනු අභියෝග වලට මුහුණ නොදීමයි ( )
7. විස්තෘත පවුල තුළ ජීවත් වීමේ දී ලැබෙන ප්‍රතිලාභ රැසකි ( )
8. ජීවිතය සාර්ථක කර ගැනීමට නිශ්චිත අරමුණක් තිබීම අනිවාර්ය නැත ( )
9. කලක මිතුරන් ඇසුර මගින් ජීවිතයට යහපත් ආදර්ශ ලබා ගත හැක ( )
10. වැඩ ලෝකය තුල ඕනෑම පුද්ගලයෙකු රැකියාවක් කරන්නේ තමාගේ යහපත වෙනුවෙන්ය ( )

## II කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

1)

i. න්‍යෂ්ටික පවුල හඳුන්වන්න
ii. විස්තෘත පවුල් තුල සාමාජිකයෙක් වශයෙන් ලැබෙන වාසි 3 ක් ලියන්න
iii. පවුල තුල දක්නට ලැබෙන පොදු ලක්ෂණ 3 ක් ලියන්න
iv. ඔබගේ ජීවිතයේ අරමුණ කුමක්ද? එම අරමුණ කරා ලගාවීමට ඔබ කළ යුතු දේ මොනවාද?

2)

i. ඔබට අභිමානයක් ගෙන දුන් කරුණක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න
ii. තමාගේ අනන්‍යතාවය පෙන්නුම් කරන කාරණා 2 ක් ලියන්න
iii. ජීවිතය සාර්ථක කරගැනීමට ඇති හිතකර බලවේග 3 ක් නම් කරන්න
iv. යහපත් ගතිගුණ ඔබ තුල වර්ධනය කිරීමට පාසැලෙන් ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න
v. ඔබගේ කල්‍යාන මිතුරා තුල දක්නට ලැබෙන යහපත් ගුණාංග 2 ක් ලියන්න

3)

i. ඔබ විවේකය ගතකරන ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න
ii. විවේකය ගතකරන ප්‍රධාන ක්‍රම 2 කුමක්ද?
iii. ඉන් එක් ක්‍රමයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න
iv. පවුලක සාමාජිකයෙකු ලෙස ජීවත්වීමේ දී ඔබට හමුවන අභියෝග 2 ක් ලියන්න
v. ඔබට දුකක් ඇති වූ විට ඔබගේ ශරීරය තුල සිදුවන ප්‍රතික්‍රියා 2 ක් ලියන්න

4)

i. වැඩ ලෝකය යනු කුමක්ද?
ii. දෙමාපියන් රැකියාවක යෙදීම නිසා පවුලේ සාමාජිකයන්ට ඇතිවන වාසි 2 ක් ලියන්න
iii. බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේ දි සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න
iv. අයිතිවාසිකම් හා යුතුකම් යන්න පහදන්න

5)

i. සිරිත් විරිත් හා සම්ප්‍රදායන් පැහැදිලි කරන්න
ii. සම්ප්‍රදායන් වලට උදාහරණ 3 ක් ලියන්න
iii. ඔබ අසල්වාසීන් සමග සුහදව කටයුතු කරන අවස්ථා 3 ක් ලියන්න
iv. අසල්වාසීන් සමග සුහදව කටයුතු කිරීමෙන් තාමට ඇතිවන ප්‍රයෝජන 3 ක් ලියන්න